# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date. 2025.12.17 |

01. ඩබ්.ජී.ඊ.පී.ඩී.වේරගොඩ,
අංක - 435, නවතල්වත්ත පාර, බුජ්ජොමුව,
අලව්ව.

02. ඩබ්.එම්.ඒ.බී.වන්සූරිය,
අංක - 1/15, නාපාන,
ගුන්නෑපාන, මහනුවර.

03. පී.බී.ඩබ්.එම්.සී.ඇහැළගොල්ල,
ලෙපෙලෝව, කිතලව.

04. එච්.ඒ.ඩී.දිල්රුක්ෂි සාගරිකා,
අංක - 33, රද්දල්ගොඩ, කල්එළිය.

05. බී.වාරිකා මදුශානි
අංක - 36/1, කන්නදෙනිය, කහපත්වල, මාවතගම.

**පැමිණිලිකරුවන්**

මහාචාර්ය ඩී.මහේෂ් එදිරිසිංහ මයා,
උපකුලපති,
වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය,
අංක - 100, කදවල, රත්මලාන.

**වගඋත්තරකරු**




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**පැමිණිලි අංකය : එච්.ආර්.සි/3715/24**

**පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :-**

උක්ත පැමිණිලිකාර පාර්ශවය විසින් 2024.08.21 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ ඔවුන් රත්මලාන වෘත්තිය තාක්ෂණ විශ්ව විද්‍යාලය යටතේ B.Tech උපාධි පාඨමාලාවක් හදාරා අවසන් කල බවත් නිසි විභාග ක්‍රමවේදයන් අනුගමනය කරමින් විභාගයට පෙනී සිටි පැමිණිලිකාර ඩබ්.ජී.ඊ.පී.ඩී.වේරගොඩ (NET/13/B1/30), ඩබ්.එම්.ඒ.බී.වන්සූරිය (NET/14/B2/15), පී.ඩී.ඩබ්.එම්.සී.ඇහැලගොල්ල (NET/14/B2/10), එච්.ඒ.ඩී.දිල්රුක්ෂි සාගරිකා (SOF/2014/B2/36) සහ ඩී.වාරිකා මධුශානි (MMW/2014/B2/18) යන අය අවසන් විභාගයට පෙනී සිටි නමුත් එහි ප්‍රථිපල ලබා නොදුන් බවත් ඒ හේතුවෙන් ඔවුන් හට අදාළ උපාධිය ලබා ගැනීමේ අවස්ථාව අහිමිවූ බවත්ය. වැඩිදුරටත් පැමිණිලි පාර්ශවය දක්වා සිටිනුයේ තම අධ්‍යයන කාලය 2023 වර්ෂයේදි සම්පූර්ණ කල බවයි.

සමත් වූ සියලු විෂයන් සහිතව විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනයක් නිකුත් කරන ලෙස ඉල්ලීම් කලද එම ප්‍රතිඵල ලේඛනය නිකුත් කිරිම ප්‍රතික්ෂේප කළ බවත් මේ සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදී විමසීම් ලිපි උපකුලපති පියාධිපති ඇතුලු ඉහළ කළමණාකරනය වෙත යොමු කිරිම සිදු කළද ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැති බවත් පැමිණිල්ල මගින් දක්වා ඇත.

එම අවස්ථාවේදී හෝ තමන් විභාගයට පෙනී සිටින අවස්ථාවේදි හෝ තමා විභාගයට පෙනී සිටිමට සුදුසුකම් සපුරා නොමැති බව කිසිදු පාර්ශවයක් විසින් ලිඛිතව හෝ වාචිකව ප්‍රතිචාර දක්වා නොමැති බව දක්වා ඇත. විභාගයට පෙනී සිටිමට සුදුසුකම් නොලබන ශිෂ්‍යයන්ගේ නම් ප්‍රසිද්ධ කිරිමක් හෝ සිදුකර නොමැති බවද දක්වා ඇත.

තමන් ඇතුලු පිරිස විශ්ව විද්‍යාලයට ඇතුල්වීමේදි ලබාදුන් ශිෂ්‍ය අත්පොතට අදාලව වසර 08 ක කාලයකදි උපාධිය සපුරාගත යුතු බව දක්වා ඇති අතර විශ්ව විද්‍යාලයට ඇතුලත් විමෙන් පසුව වසර 7 ක් තුල උපාධිය සම්පූර්ණ කළ යුතු බවට වගඋත්තරකරුවන් දැනට කරනු ලබන ප්‍රකාශ ඊට පූර්වයෙන් දැනුම්වත් කර නොමැති බවත් මෙම පාඨමාලාවට අදාළව නිකුත් කළ ශිෂ්‍ය අත්පොතෙහිද සඳහන් නොවන බවත් මෙම අසාධාරණය සම්බන්ධයෙන් උපකුලපති සමග සාකච්ජා කිරිමට කිසිදු අවස්ථාවක් ලබා නොදුන් බවත් කිසිදු වගකිය යුතු පාර්ශවයක් මේ සම්බන්ධයෙන් මැදිහත් නොවූ බවත් දක්වා ඇත.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්විම :-**

වගඋත්තරකරු කොමිෂන් සභාව වෙත ලිඛිතව කරුණු දක්වමින් සඳහන් කරනුයේ 2008 අංක 31 දරණ වෘත්තිය විශ්ව විද්‍යාල පනතේ 61 (01)අ වගන්තිය යටත් වෙන රෙගුලාසි අංක 01-01 හි 4.7 වගන්තිය අනුව ශිෂයෙක් ලියාපදිංචි වී අධ්‍යයන වසර 07 ක් ඇතුලත උපාධිය ලබා ගැනිම සඳහා සියලු සුදුසුකම් සැපිරිය යුතු බවත් පැමිණිලිකාර ශිෂ්‍ය කණ්ඩායම එම රෙගුලාසිය සම්පූර්ණ කර නොමැති බවත්ය.

අධ්‍යයන කාලය තීරණය කරනු ලබනුයේ ලිත් වර්ෂ වලින් නොවන බවත් අධ්‍යයන වර්ෂ වලින් බවත් අධ්‍යයන වර්ෂයක් යනු මාස 06 ක කාලසීමා දෙකක කාලයක් බවද දක්වා ඇත.

ඒ අනුව 2014 B2 කණ්ඩායමේ සිසුන්ගේ අධ්‍යයන වර්ෂ 07 කාල සීමාව 2022.12.01 දින ද, 2013 B2 කණ්ඩායමේ සිසුන්ගේ අධ්‍යයන වර්ෂ කාල සිට 2021.12.01 දිනෙන් ද අවසන් වන බව කරුණු දක්වා ඇත.

පැමිණිලිකාර පාර්ශවය අධ්‍යයන කාල සීමාවෙන් පසුව පෙනී සිටි විභාග වල ප්‍රතිඵල නිකුත් නොකිරිමට හේතුව අදාළ කාලය වන විට සිසුන්ගේ වලංගු කාලය ඉක්මවා ගොස් තිබීම බවත් වසර 07 ක් ඇතුලත අධ්‍යයන කටයුතු සම්පූර්ණ කල යුතු බව විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් ලියාපදිංචි වන මුල් අවස්ථාවේදිම ඔවුනට දැනුවත් කරන බවද

2024.01.24 දින සිසුන් පිරිසක් විසින් සිදු කරන ලද මෙවැනිම ඉල්ලීමකටද අධ්‍යයන මණ්ඩලය විසින් අනුමැතිය ලබා නොදුන් බවද දක්වා ඇත.

**විමර්ශනය :-**

පැමිණිලිකාර පාර්ශවය විසින් පැමිණිල්ල තුලින් දක්වා සිටිනුයේ ඔවුන් සියලු විෂයන් සමත් වු උපාධිය ඔවුනට පිරිනමා නැති බවය.

වගඋත්තරකාර පාර්ශවය කරුණු දක්වමින් පවසා සිටිනුයේ 2008 අංක 31 දරණ වෘත්තිය විශ්ව විද්‍යාල පනතේ රෙගුලාසි වලට අනුව අදාළ සිසුන් පිරිසට වසර 07 ක් තුල අධ්‍යයන කටයුතු අවසන් කිරිමට නොහැකි විම හේතුවෙන් උපාධිය ප්‍රදානය කිරිමක් සිදු කල නොහැකි බවය.

මේ සම්බන්ධයෙන් 2025.03.20 වන දින කොමිෂන් සභාව විසින් පැවැත්වූ පරීක්ෂණයේදී පැමිණිලිකාර පාර්ශවය වාචික කරුණු දක්වමින්දන්වා සිටියේ 2013 සහ 2014 වර්ෂයේදී පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේදී ලබා දුන් ශිෂ්‍ය අත්පොතෙහි පාඨමාලාව සම්පූර්ණ කළ යුතු කාල සීමාව ලෙස වසර 8 ක සීමාවක් දක්වා ඇති බවය.එම ශිෂ්‍ය අත්පොත නිරීක්ෂණය කිරීමේදී පාඨමාලාව සම්පූර්ණ කල යුතු කාලසීමාව වසර 08 ලෙස සඳහන් වී තිබෙන බව නිරීක්ෂණය වේ.

මෙම පාඨමාලාව සම්පූර්ණ කළ යුතු කාලසීමාව වසර 7 ක් ලෙස අනු නීතිවල දක්වා ඇති බව වගඋත්තරකාර පාර්ශවය සඳහන් කලද මෙම අනුනීති විශ්ව විද්‍යාලයේ නිල වෙබ් අඩවිය තුල නොතිබුණු බවත් මෙම සිදුවීමෙන් අනතුරුව 2024.02.19 දින වෙබ් අඩවියට අනුගත කර ඇති බවත් 2019 වර්ෂයේ ශිෂ්‍ය අත්පොතෙහිද මෙම කාල සීමාව පිළිබඳව දක්වා නොමැති බවත් පැමිණිලිකාර පාර්ශවය කරුණු සනාථ කරයි.

වගඋත්තරකාර පාර්ශවය පවසා සිටිනුයේ 2010 වර්ෂයේ අනු නීති සියල්ලක්ම ආයතනය විසින් එළිදැක්වූ බවත් එහි 3:1:5 යටතේ අවුරුදු 7 ක කාල සීමාව නොඉක්මවිය යුතු බව සඳහන් කර ඇති බවය.

2025.06.27 දින කොමිෂන් සභාව විසින් සිදු කරන ලද පරීක්ෂණයේදි වගඋත්තරකාර පාර්ශවය පවසා සිටිනුයේ 2013-2014 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්ව විද්‍යාලය විසින් නිකුත් කරන ලද ශිෂ්‍ය අත්පොතෙහි වූ අවුරුදු 8 ක කාල සීමාව අවුරුදු 07 ක් ලෙස 2015 වසරේදී වෙනස් කළ බවත් එම වෙනස් වීම සම්බන්ධයෙන් ශිෂ්‍යයන් දැනුවත් කරන ලෙස සම්බන්ධීකාරකවරුන්ට වාචික උපදෙස් ලබා දුන් බවත් ඔවුන් විසින් ශිෂ්‍යයන් වාචිකව දැනුවත් කළ බවත්ය.

එමෙන්ම පැමිණිලිකාර සිසුන්ට ඊමේල් පණිවිඩයක් මගින් විභාගය ලිවීම සඳහා අවස්ථාව ලබාදීම පිළිබඳව කොමිසම විසින් සිදු කළ ප්‍රශ්න කිරීමේදී විශ්ව විද්‍යාලය විසින් කාලය අවසන් වූ සිසුන් සඳහා අවස්ථාවක් ලබාදීමට කටයුතු කිරීම වරදක් බව වගඋත්තරකාර පාර්ශවය පිලිගෙන ඇත.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් පැමිණිලිකාර පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි අනුව 2013-2014 වසර වල ශිෂ්‍ය අත්පොත පරික්ෂා කිරීමේදී පෙනී යන්නේ ඒවා උපාධිය ලබා ගැනීම සඳහා සැපිරිය යුතු අවශ්‍යතා වල උපාධිය සම්පූර්ණ කළ යුතු උපරිම කාල සීමාව ලෙස සිසුවෙකු පළමු ලියාපදිංචි දිනයේ සිට අවසාන වර්ෂ 8 ක් ඇතුලත උපාධිය සම්පූර්ණ කර නොමැති නම් උපාධිය සඳහා සුදුසුකම් නොලබන බව දක්වා ඇති බවයි.

තවද මෙම ශිෂ්‍යයන් විසින් උපකුලපති, පීඨාධිපති ඇතුලු විශ්ව විද්‍යාලයේ ඉහළ කළමණාකාරිත්වයට අධ්‍යයන කාලසීමාව පිළිබඳව වූ ගැටලුව සම්බන්ධයෙන් ලිපි යොමුකර තිබුණද ඒ සම්බන්ධයෙන් කිසිදු සාධනීය පිළිතුරක් මෙම සිසුන්ට ලැබී නොමැති බව කොමිසම නිරික්ෂණය කරයි.

2023.02.07 වන දින ඊමේල් පණිවිඩයක් මගින් විභාගයට සහභාගී වන ලෙස පැමිණිලිකාර පාර්ශවය වෙත දක්වා තිබීම තුලින් අදාල අවුරුදු 8 ක කාලසීමාව පිළිබඳව ගැටලුවක් නොමැති බවට සිසුන් විසින් සුජාත බලාපොරොත්තුවක් පවත්වා ගෙන ඇති බවට කොමිසම කරුණු නිරික්ෂණය කරයි.

වගඋත්තරකාර පාර්ශවය විසින් සාක්ෂි ලෙස ඉදිරිපත් කර ඇති විශ්ව විද්‍යාලය විසින් නිකුත් කරන ලද By laws ලේඛනයේ 3.1.5 අනු නීතියට අනුව අවුරුදු 7 ක් නොඉක්මවන කාලයක් තුල උපාධිය අවසන් කළ යුතු බව දක්වා තිබුණද පැමිණිලිකාර පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි අනුව නිරික්ෂණය වන්නේ එම ලේඛනය 2024 පෙබරවාරි 19 වන දින විශ්ව විද්‍යාලයේ වෙබ් අඩවියට උඩුගත කර ඇති බවය.

තවද එවන් ලේඛනයක් පිළිබඳව කිසිදු දැනුවත් කිරිමක් පිළිබඳව විශ්ව විද්‍යාලය විසින් සිදුකර නොමැති බව පැමිණිලිකාර පාර්ශවය විසින් වාචිකව කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇති අතර වගඋත්තර පාර්ශවය වෙනුවෙන් බලය පවරා සහභාගී වූ නියෝජිතද දක්වා ඇත්තේ, කථිකාචාර්යයවරුන් ඒ පිලිබඳ ඔවුන්ගේ දේශන වලින් ළමුන් දැනුවත් කර ඇති බවයි. එහෙත් ඒ බව තහවුරු කරන කිසිදු සාක්ෂියක් හෝ දිවුරුම් ප්‍රකාශයක් හෝ වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කර නොමැති අතර, එම දැනුවත් කිරිම කල බව දක්වන කරුණු පැමිණිලිකාර පාර්ශවය ප්‍රතික්ෂේප කරයි.

උක්ත කරුණු අනුව විශ්ව විද්‍යාලය විසින් අනු නීති ලේඛනයක් ව්‍යවස්ථාපිත කොට තිබුණද එම ලේඛනයට ශිෂ්‍යයන්ට ප්‍රවිශ්ය විමක් හෝ එහි අන්තර්ගතය පිළිබඳව ශිෂ්‍යයන්ට නිසි ආකාරයට දැනුවත් කිරිමක් සිදු කිරිමට විශ්ව විද්‍යාල පරිපාලනය අපොහොසත් වී ඇති බව කොමිෂන් සභාවේ අවධානයට ලක්වේ. වගකිව යුතු අධ්‍යාපන ආයතනයක් ලෙස විශ්ව විද්‍යාලය තුල සිදුවන පරිපාලන තීන්දු වෙනස්විම් ශිෂ්‍යයන් වෙත වාචිකව දැනුම්දීම යුක්ති සහගත නොවන බව කොමිසම තීරණය කරන අතර තොරතුරු සන්නිවේදනය සම්බන්ධයෙන් ප්‍රමිතියක් සහිත ක්‍රමවත් ක්‍රමවේදනයක් අනුගමනය කර නොතිබිම අවධානයට ලක් වේ.

උපාධිය ලබා ගැනීමට අවශ්‍ය සියලු සුදුසුකම් අවුරුදු 8 ක කාලසීමාවක් තුල සපුරා තිබිය යුතු බවට මෙම පාඨමාලාවට ලියාපදිංචි වීමේදි ඒ සම්බන්ධයෙන් වන 2013 ශිෂ්‍ය අත්පොතෙහි ලිඛිතව සඳහන් වීමක් තුලින් එම නීතිය ඒ ආකාරයටම ක්‍රියාත්මක වේ යැයි නීත්‍යානුකූල අපේක්ෂාවක් මෙම ශිෂ්‍ය කණ්ඩායමට ඇති වූ බව පිළිගත හැකිය.

එලෙස අවුරුදු 8 ක් ලෙස දක්වා තිබූ කාල පරාසය අවුරුදු 7 ක් ලෙස 2015 වසර තුල වෙනස් කිරීම තුලින් ශිෂ්‍යයන් විශ්ව විද්‍යාල පරිපාලනය කෙරෙහි තැබූ නීත්‍යානුකූල අපේක්ෂාව කඩ වී ඇති බවත් එය සම්බන්ධීකාරකවරුන් හරහා ශිෂ්‍යයන් වෙත වාචිකව පමණක් දැනුම් දීමත් ඊමේල් පණිවිඩයක් මගින් පැමිණිලිකාර පාර්ශවය වෙත විභාගය සඳහා සහභාගී වන ලෙස දන්වා තිබීමත් විශ්ව විද්‍යාල පරිපාලනයේ වගකීම් විරහිත ක්‍රියාවක් බව කොමිසම නිරීක්ෂණය කරයි.

පැමිණිලිකරුවන් විසින් විභාගය සඳහා පෙනී සිටීමට අවසර ඉල්ලා සිටි අවස්ථාවේදි විශ්ව විද්‍යාලයේ අනු නීති 3.1.5 අනුව අදාළ පාඨමාලාව අධ්‍යපන වර්ෂ 07 ක් තුළ සම්පූර්ණ කළ යුතු බවත් පැමිණිලිකරුවන් එකී කාල සීමාව ඒ වන විට ඉක්මවා ගොස් ඇති බැවින් විභාගයට පෙනී සිටීමට අවසර ලබාදිය නොහැකි බවත් වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරුවන් වෙත පූර්වයෙන් දැනුම් දිය හැකිව තිබිණි. එවැනි කිසිදු දැනුම් දීමක් සිදු නොකොට එම අවස්ථාවේදී විභාගයට පෙනී සිටීම සඳහා අවසරය ලබාදී පසුව ප්‍රතිඵල නිකුත් නොකර සිටීම යුක්ති සහගත නොවන බවද කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වන අතර, විභාගයට පෙනී සිටීමෙන් පසු ප්‍රතිඵල ලබා ගැනීමේ අයදුම්කරුවන්ගේ නීතිමය අපේක්ෂාවද උල්ලංඝනය කර ඇති බවද පෙනී යයි.

තවද වගඋත්තර පාර්ශවය 2025.06.27 දිනැතිව පැවති පරීක්ෂණයේදි දැනුම් දුන්නේ මෙම පැමිණිලිකරුට අදාල අධ්‍යන වර්ෂයන් අවසන් වූ කාලසීමාව පිළිබඳව කලානුරූපී වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසයි. නමුත් වගඋත්තර පාර්ශවය එම වාර්තාව නියමිත කාලය එනම් 2025 ජූලි මස තුළ හෝ මේ දක්වා ඉදිරිපත් කිරීමට සමත්ව නැත.

තවද පැමිණිලිකාර පාර්ශවය විසින් වගඋත්තර පාර්ශවයේ මෙහෙයුම් අකර්යක්ෂමතා පිළිබද 2022 වර්ෂයේ වූ විගණන වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර එම වාර්තාවේ 3.1 මෙහෙයුම් ආකාර්යක්ෂමතා යටතේ 2019-2021 වර්ෂ වල පවත්වන ලද විභාග 53 ක සිසුන්ගේ ප්‍රතිශතය හා සමත් වීමේ ප්‍රතිශතය දක්වා විභාගයට සහභාගී නොවීම හා සමත් වීමේ ප්‍රතිශතය අඩුවීම පිලිබඳ අවධානය යොමු වී නොමැති බවත් ඒ පිළිබඳ සොයා බලන ලෙස නිර්දේශ කර ඇත. ඒ අනුව එම කාල සීමාව මෙම සිසුන්ට ද ප්‍රශ්ණ සහගත කාල සීමාවක් විය හැක. එසේම 2020 වසරේ සිට 2022 වසර දක්වා කාලය තුළ රටේ පැවති කොවිඩ් වාතාවරණය සමග අධ්‍යයන වර්ෂය සම්පූර්ණ කිරීම කළ බව පිළිගත හැකි කරුණක් නොවේ.

දයාරත්න එදිරිව සෞඛ්‍ය අමාත්‍යාංශය (1999 )1 SLR 393 නඩුවෙහි අමරසිංහ විනිසුරුතුමා පවසා සිටින්නේ ප්‍රතිපත්ති වල සිදුවන වෙනස්කම් තුලින් පුද්ගලයන්ගේ නිත්‍යානුකූල අපේක්ෂාවන් කඩවීමට ඉඩ ඇති විට එය ඔවුනට අහිතකර ආකාරයට බලනොපාන බව දැනුවත් වීමට ඔවුනට අවස්ථාව ලබා දිය යුතු බවත්, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව යටතේ සියලුම පුද්ගලයන්ට සැලසෙන සමාන ආරක්ෂාවන් සනාථ කිරීමේදි වැදගත් බලපෑමක් ඇති කරන බවත්ය.

සමරකෝන් සහ තවත් අය එදිරිව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ තවත් අය නඩුවෙහි බණ්ඩාරනායක විනිසුරුතුමිය පවසා සිටින්නේ නිත්‍යානුකූල අපේක්ෂාවක් ඇති වන්නේ බලය ඇති පුද්ගලයෙකු විසින් ලබා දෙන වගකිමක් හෝ පොරොන්දුවකින් බවත් එවැනි පොරොන්දුවක් ඍජුව ප්‍රකාශ නොවුවවද අවට තත්වයන්ගෙන් සහ අවස්ථාවන්ගෙන් එය අවබෝධ කර ගත හැකි බවත්ය.

උක්ත කරුණු අනුව පෙනී යන්නේ විශ්ව විද්‍යාලය කෙරෙහි ශිෂ්‍යයන් තැබූ නිත්‍යානුකූල අපේක්ෂාව කඩ වී ඇති බවත් විශ්ව විද්‍යාලය තම පරිපාලනමය වගකීම් නිසි ආකාරව ඉටු කර නොමැති බවත්ය.

ඒ අනුව පැමිණිලි පාර්ශවය සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 12 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වන ආකාරයෙන් ක්‍රියා කොට ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තීරණය කරයි.

**ඒ අනුව පහත පරිදි නිර්දේශ කරයි.**

01. පැමිණිලිකරුවන් හට අවසන් විභාගයේ ප්‍රතිඵල නිකුත් කර, එකී ප්‍රතිඵල මත උපාධිය ලැබීමට සුදුසුකම් සපුරා ඇති පැමිණිලිකරුවන් සඳහා B.Tech උපාධිය පිරිනැමීමට වගඋත්තරකාර පාර්ශවය විසින් කටයුතු කළ යුතුය.

02. වගඋත්තරකාර පාර්ශවය මෙම සිදුවීමේදි ක්‍රියා කර ඇති ආකාරය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතුය.

2026.02.05 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරුවන් විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් - 01. අමාත්‍යතුමා,
අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශය,
අංක - 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

02. ලේකම්,
අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තිය,
අධ්‍යාපන අමාත්‍යාංශය,
අංක - 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07
} නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා